# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 14 දරන මහරගම පමුණුව සුවරිතෝදය සමාජ සේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 මැයි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මැයි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# 2000 අංක 14 දරන මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 22 වන දින.]

එල්.ඩී.—ඕ. 58/98.

## මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, එම පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථක ලෙස කරගෙන ගොස් ඇති හෙයින්, සහ එකී සංගමය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම්කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2000 අංක 14 දරන මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංගමයට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් "මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද, එකී නාමයෙන් සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පැවරීමට හා පවරනු ලැබීමට ද හැක්කේ ය. මහරගම පමුණුව සුචරිතෝදය සමාජ සේවා සංගමය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මහලු නිවාස හා ළමා නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ආ) අනාථ නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඇ) මන්ද බුද්ධිකයන්ගේ හා අංග විකලවූවන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඈ) රැකී රක්ෂා නැති අයට රක්ෂා ලබාදීම හා ඔවුනට විවිධ කර්මාන්ත පුහුණුව ලබාදීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා සහ වඩාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා සහ දේ කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ නිළධරයන්ගෙන් සහ සංස්ථාවේ රීති මගින් විධිවිධාන යොදා ඇති පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලැබූ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුව විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, එහි කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට ඉහතින්ම වූ දිනයේ දී සංගමයේ කළමනාකරණ කමිටුවේ ධුර දරනු ලැබුවා වූ ද, මේ පනතේ උපලේඛනයෙහි නම් සඳහන් වන්නා වූ ද, තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම සඳහා ද, කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන්

ද කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා ද සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණෙන, ඡන්දය දෙන සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනිම රැස්වීමක දී ඒ හා සමාන ආකාරයෙන් ම වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් තත්කාලයේ, සංස්ථාවේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, හුවමාරු කිරීමක් හෝ අන්තිම කැමති පත්‍රයකින් නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයෙන් හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස්කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයෙන් නියාදනය කිරීමට පූර්ණ බලය සහිතව මේ පනතේ කාර්යය සඳහා සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු ණය හා ගෙවිය යුතු දායක මුදල් හා සාමාජික මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි යම් තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඒ තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන්, ඒ සාධන පත්‍රයෙහි අත්සන් තැබිය යුතු ය. තවද, එසේ අත්සන් තැබීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් තැබීමට පරිබාහිරව විය යුතු ය.

ද කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා ද සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණෙන, ඡන්දය දෙන සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනිම රැස්වීමක දී ඒ හා සමාන ආකාරයෙන් ම වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් තත්කාලයේ, සංස්ථාවේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, හුවමාරු කිරීමක් හෝ අන්තිම කැමති පත්‍රයකින් නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයෙන් හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස්කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයෙන් නියාදනය කිරීමට පූර්ණ බලය සහිතව මේ පනතේ කාර්යය සඳහා සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු ණය හා ගෙවිය යුතු දායක මුදල් හා සාමාජික මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි යම් තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඒ තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන්, ඒ සාධන පත්‍රයෙහි අත්සන් තැබිය යුතු ය. තවද, එසේ අත්සන් තැබීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් තැබීමට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපල.

**10.** සංස්ථාව විසුරුවා හරිනු ලැබීමේ දී සංස්ථාවේ ණය හා බැරකම් පියවීමෙන් පසුව යම් දේපළක් ශේෂ වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදාදීම නොකළ යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ වෙනත් සංගම්වලට දීම හෝ පැවරීම කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හෝ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට, මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය [5(2) වගන්තිය]

කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| සභාපති : | එච්. එම්. මුතුබණ්ඩා මහතා |
| උප සභාපති : | පත්මසේන අල්විස් මහතා |
| සම ලේකම්වරු : | ඇම්. ඇස්. පෙරේරා මහතා<br>සෝමා සෙනෙහේලතා මහත්මිය |
| භාණ්ඩාගාරික : | එච්. එම්. මනතුංග මහතා |
| කාරක සභාව : | ඒ. ගුණසේන පෙරේරා මහතා<br>අමරදාස ජයතුංග මහතා<br>අජිත් ප්‍රේමලාල් මහතා<br>රණසිංහ බී. කරුණාතිලක මහතා<br>ඩබ්ලිව්. ඒ. ආර්. කරුණාතිලක මහතා<br>සුගතපාල විජේසේකර මහතා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.